# මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
# நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சு
# MINISTRY OF FINANCE AND MASS MEDIA

මහලේකම් කාර්යාලය, කොළඹ 01.
ශ්‍රී ලංකාව

செயலகம், கொழும்பு 01.
இலங்கை

The Secretariat, Colombo 01.
Sri Lanka

| | | | | |
|---|---|---|---|---|
| කාර්යාලය / அலுவலகம் / Office | - මුදල් / - நிதி / - Finance | (+94)-11-2484500<br>(+94)-11-2484600<br>(+94)-11-2484700 | ෆැක්ස් / பெக்ஸ் / Fax - මුදල් / - நிதி / - Finance | (+94)-11-2449823 |
| කාර්යාලය / அலுவலகம் / Office | - ජනමාධ්‍ය / - வெகுசன ஊடக / - Mass Media | (+94)-11-2513459<br>(+94)-11-2513498<br>(+94)-11-2512324 | ෆැක්ස් / பெக்ஸ் / Fax - ජනමාධ්‍ය / - வெகுசன ஊடக / - Mass Media | (+94)-11-2513458 |

වෙබ් අඩවි / வெப் சைட்கள் / Websites: www.treasury.gov.lk, www.media.gov.lk


මගේ අංකය / எனது இல. / My No. BD/CPB/4/1/9-2018

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2017.12.27

**අයවැය චක්‍රලේඛ අංක: 03/2017**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා සභාපතිවරුන් සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

## 2018 අයවැය - වියදම් දැරීම සඳහා බලය දීම

### (01) වියදම් දැරීමේ අධිකාරී බලය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 150(1) ව්‍යවස්ථාවේ සහ 2017.12.09 වන දින පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2017 අංක 30 දරන විසර්ජන පනතෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව 2018 වර්ෂයට අදාළ වන වියදම් දැරීම සඳහා ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින් වොරන්ට් බලපත්‍ර අත්සන් තබා ඇත.

ඒ අනුව, ගෙවීම් වවුචර්පත් හා වෙනත් ලියවිලි මත පහත සඳහන් පරිදි අදාළ අධිකාරිය සටහන් කළයුතු වේ.

(අ) සාමාන්‍ය පොදු සේවා සඳහා - 2018 අංක 1 දරන සාමාන්‍ය වොරන්ට් බලපත්‍රය

(ආ) විශේෂ නීති සේවා සඳහා - 2018 අංක 1 දරන විශේෂ නීති බලපත්‍රය

(ඇ) අත්තිකාරම් ගිණුම් කටයුතු සඳහා - 2018 අංක 1 දරන අත්තිකාරම් බලපත්‍රය

### (02) ජාතික අයවැය ක්‍රියාත්මක කිරීම

රජයේ ප්‍රමුඛතාවයන් මත පදනම්ව සකස් කරන ලද 2018 අයවැයෙහි සඳහන් සියළුම වැඩසටහන් හා ව්‍යාපෘතිවල එම වර්ෂයට අදාළව කාර්ය සාධන දර්ශක (KPI) පදනම් කරගෙන, ලඟාකර ගතයුතු ඉලක්ක සපුරා ගැනීමට හැකිවන පරිදි අවශ්‍ය ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ගන්නා ලෙස සියළුම වැය දරන ආයතනවලින් ඉල්ලා සිටිනු ලැබේ. 2018 අයවැය යෝජනා මගින් ඉදිරිපත් වූ යෝජනාවන්ට අදාළ අයවැය ප්‍රතිපාදන ඉතා කඩිනමින් ඔබ වෙත වෙන්කර දීමට කටයුතු කරන අතර, ඒ අනුව අදාළ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා මෙන් වැඩිදුරටත් ඉල්ලා සිටිමි. අයවැය යෝජනා ඇතුළු සියළුම මූලධන වියදම් අධීක්ෂණය කිරීම සඳහා වෙනම අංශයක් ජාතික අයවැය දෙපාර්තමේන්තුව යටතේ දැනටමත් පිහිටුවනු ලැබ ඇති අතර, අවශ්‍ය ඉලක්කයන් ළඟාකර ගැනීම සහතික වීම සඳහා මෙම අංශය සමඟ සමීපව සම්බන්ධීකරණය වී කටයුතු කළයුතුය. මෙයට අදාළ වැඩිදුර උපදෙස් වෙනම නිකුත් කිරීමට කටයුතු කෙරේ.

**(03)** **කාර්තුමය වියදම් සීමාවන්**

2018 වර්ෂයට අදාළව විසර්ජන පනත මගින් වෙන්කරන ලද වියදම් සීමාවන් කාර්තු අනුව තවදුරටත් බෙදා වෙන්කිරීමට දැනටමත් පියවර ගෙන තිබේ. ඒ අනුව, මහා භාණ්ඩාගාරය විසින් මුදල් නිදහස් කිරීමේදී කාර්තුමය සීමාවන්ට අනුව සිදුකරන බැවින්, එම සීමාවන් තුළ ක්‍රියාකාරී සැලසුම් හා ප්‍රසම්පාදන සැලසුම් සකස් කර ගැනීමට කටයුතු කරන මෙන් සියළුම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හා ගණන්දීමේ නිලධාරීන් වෙත මෙයින් දැනුම්දෙනු ලැබේ. මෙම ක්‍රියාමාර්ගය තුළින් වියදම් දරණ ආයතන සඳහා මුදල් නිදහස් කිරීම කාර්යක්ෂම කිරීමට අපේක්ෂා කෙරේ. මේ පිළිබඳ වැඩිදුර උපදෙස් රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 263/2017 න් ලබාදී ඇත.

**(04)** **බැඳීම් කළමනාකරණය**

මුදල් රෙගුලාසි ප්‍රකාර සෑම වියදමක් සඳහාම බැඳීම් ඇතිකර ගැනීමට පෙර ඒ සඳහා අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන පවතින බවට තහවුරු කරගත යුතුය. මුල්‍ය ප්‍රතිපාදන රහිතව ඇතිකර ගනු ලබන බැඳීම් සඳහා මහා භාණ්ඩාගාරය වගකීමට බැඳී නොසිටින බැවින්, අදාළ නිලධාරීන් විසින් ඒ සම්බන්ධයෙන් පුද්ගලිකව බැඳීමට යටත් වනු ඇත. එසේම, අළුතින් බැඳීම්වලට එළඹීමට පෙර පවත්නා බැඳීම් හා වගකීම් නිරවුල් කිරීමට දැනට වෙන්කර ඇති ප්‍රතිපාදන යොදාගත යුතුය. ඒ අනුව, 2017 වර්ෂය අවසාන වන විට නිරවුල් කිරීමට නොහැකි වූ බැඳීම් 2018 වර්ෂයේ ප්‍රතිපාදන යොදාගෙන නිරවුල් කිරීමට කටයුතු කළයුතුය. බැඳීම් කළමනාකරණය පිළිබඳව රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 හි විධිවිධානවලට අනුකූලව කටයුතු කළයුතුය.

**(05)** **අත්තිකාරම් ගිණුම් කටයුතු**

අත්තිකාරම් ගිණුම් කටයුතු පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද සීමාවන් තුළ කළමනාකරණය කළයුතුය. මේ යටතේ ලබාදෙන ණය අත්තිකාරම් ආපසු අයකර ගැනීමේදී ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ සඳහන් පරිදි වාරික ගණනය කිරීමට කටයුතු කළයුතු බව අවධාරණය කරමි.

**(06)** **පැහැදිලි කරගැනීම්**

මෙම චක්‍රලේඛය පිළිබඳව යම් පැහැදිලි කරගැනීමක් අවශ්‍ය වේ නම්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්.අනෝමා නන්දනී මහත්මිය (දුරකථන අංක 011-2484681) වෙතින් ලබාගත හැක.

**ඒ.ආර්.දේශප්‍රිය**
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්

අත්.කලේ/ **ආර්.එච්.එස්.සමරතුංග**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. විගණකාධිපති